තුම්පත් රටා - 1

# සිංහල වෙහෙර විහාර

© Sumitha Publish

**ජේ. බී. දිසානායක**
කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ සම්මානිත මහාචාර්ය

7



රිදී විහාරය: උඩ බිත්තියේ ඇති දේවරූප

Sumitha Publish

11



තෙල්වත්ත රජමහ විහාරය: අනංග රූපය

Sumitha Publish

# පටුන


පෙරවදන

1. සිංහල ගමයි පන්සලයි 1
2. රිදී විහාරය 10
3. රාජ මහා විහාරයක රාජකාරි 18
4. දෙගල්දොරුව 25
5. ඊතුලම 34
6. තොටගමුව 44
7. මුල්ගිරිගල 54
8. තන්තිරිමලේ 64

අනුග්‍රහය දැක්වූවෝ 73

පසුවදන 74

සූචිය 80


Sumitha Publish

# පෙරවදන

සමාජයක උපත ලබන දරුවා තමා අවට සිටින වැඩිහිටියන් කරන දේ කරන්නටත්, කියන දේ කියන්නටත්, සිතන ලෙස සිතන්නටත් හුරු පුරුදු වේ. කලක් යෑමේදී මේ දරුවා ඒ සමාජයේ පූර්ණ සාමාජිකයෙකු බවට පත් වේ. සමාජයක පූර්ණ සාමාජිකයෙකු සේ හැසිරීම සඳහා කෙනෙකු විසින් අමුතුවෙන්ම හුරු පුරුදු කොට ගත යුතු සියල්ලද දැනුම් වෙසෙසද 'සංස්කෘතිය' නම්.

සිංහල සමාජයෙහි හැදෙන වැඩෙන දරුවා සිංහල සංස්කෘතියද, ජපන් සමාජයෙහි හැදෙන වැඩෙන දරුවා ජපන් සංස්කෘතියද අප්‍රිකාවේ කිකුයු ගෝත්‍රික සමාජයෙහි හැදෙන වැඩෙන දරුවා කිකුයු සංස්කෘතියද යනාදී වශයෙන් ඒ ඒ සමාජවල හැදී වැඩෙන්නෝ ඒ ඒ සමාජවලට ආවේණික සංස්කෘතික රටාව උගනිති.

Sumitha Publish

සමාජයක පූර්ණ සාමාජිකයෙකු වීම සඳහා උගත යුතු දේ බොහෝය. ඒ සමාජයෙහි වෙසෙන්නන් කන බොන හැටි, අඳින පලඳින හැටි, අඬන දොඬන හැටි, නෑදෑකම් පවත්වන හැටි, ගමන් බිමන් යන හැටි, කෙළි සෙල්ලම් කරන හැටි, වඳින පුදන හැටි ආදිය පමණක් නොව සිතන පතන හැටි පවා උගත යුතුය.

සිංහලයෙකු සේ හැසිරීම සඳහාද නොයෙක් දේ උගත යුතුය. පළමුව ඔහු සිංහල භාෂාවෙන් කතා බස් කිරීමට උගත යුතුය. දෙවනුව ඔහු සිංහලයන් කරන දේ ඒ සැටියෙන්ම කිරීමට පුරුදු විය යුතුය. තෙවනුව ඔහු සිංහලයෙකු මෙන් සිතීමට පුහුණු විය යුතුය. මේ පරිද්දෙන් සිංහලයෙකු සේ කටයුතු කිරීමට කෙනෙකු විසින් උගත යුතු සියල්ල 'සිංහල සංස්කෘතිය' වේ.

සිංහල ගැමි ජනතාව අතර පවත්නා සිරිත් විරිත්, සිතුම් පැතුම්, අදහස් උදහස් ආදිය නාගරිකයන් අගේ කරන සිරිත් විරිත් ආදියට වඩා වෙනස්ය. ගැමියන්ගේ ගෙවල් දොරවල්, ඇඳුම් පැලඳුම්, බඩු මුට්ටු, ආහාර පාන ආදියෙන් පමණක් නොව

කතා බහින්ද 'ගැමි සුවඳක්' වහනය වේ. සිංහල ගැමි සමාජයෙහි සිතුම් පැතුම් හා කියුම් කෙරුම් මෙහෙයවනු ලබන්නේ 'සිංහල ගැමි සංස්කෘතිය' විසිනි.

සිංහල ගැමි සංස්කෘතියෙහි ස්වභාවය හඳුනා ගැනීමට මම කාලයක සිට වෑයම් කරමින් සිටිමි. ඒ අරමුණ පෙරදැරි කොට ගෙන, සිංහල ගම් නියම්ගම්වලට ගොස් ගැමියන් හමු වී කතා බස් කෙළෙමි. ඔවුන් කතා බස් කරන හැටි පවා විමසිල්ලෙන් සොයා බැලීමි. ඔවුන් විසින් කටින් කට පවත්වා ගෙන එනු ලබන ජනප්‍රවාදවලටත් ජන කවිවලටත් මහත් අභිරුචියෙන් සවන් දුනිමි.

මේ වෑයමේ ප්‍රතිඵලයක් වශයෙන් මා සොයාගත් නොයෙක් තොරතුරු වරින්වර ජනමාධ්‍යයෙන් ඉදිරිපත් කෙළෙමි; දැනුදු ඉදිරිපත් කරමි. සිංහල ගැමියන්ගේ බස් වහර පිළිබඳව මා සොයාගත් තොරතුරු සමහරක් 'සිංහල ජන වහර' යනුවෙන් 'නවයුගය' නම් අධ්‍යාපනික පුවත්පතෙහි පළ කරනු ලැබිණ. මේ ලිපි අතුරින් කිහිපයක් 1976 දී 'සිංහල ජන වහර' යන නමින් පොතක් වශයෙන් ප්‍රසිද්ධියට පමුණුවන ලදී.

© Sumitha Publish

සිංහල ගැමි සංස්කෘතිය පිළිබඳ තවත් තොරතුරු සමුදායක් ඉදිරිපත් කිරීමට ගුවන්විදුලි මාධ්‍යය උපකාරී විණ. මේ විෂය අළලා සතිපතා වැඩ සටහනක් මෙහෙයවන මෙන් 1979 දී ලංකා ගුවන්විදුලි සංස්ථාවෙන් ආරාධනයක් මට ලැබිණ. ඒ අනුව 'තුම්පත් රටා' නම් වැඩ සටහනක් තුන් අවුරුදු තුන් මසක් පවත්වා ගෙන යෑමට ගුවන්විදුලි සංස්ථාවේ පූර්ණ අනුග්‍රහය මට නොමඳව ලැබිණ.

'තුම්පත් රටා' වැඩ සටහන ගැමියන් අතර පමණක් නොව නාගරිකයන් අතරද බෙහෙවින් ජනප්‍රිය වූවක් බව සමීක්ෂණ වාර්තාවලින් හෙළි වේ. 1981 දී ගුවන්විදුලි සංස්ථාව මගින් දීපව්‍යාප්තව පවත්වන ලද සමීක්ෂණයේ වාර්තාව අනුව 'තුම්පත් රටාව' ඒ අවුරුද්දේ හොඳම වැඩ සටහන වශයෙන් ශ්‍රාවකයන් විසින් තෝරා ගෙන තිබිණ.

‘තුම්පත් රටා’ වැඩ සටහන්, පොතක් වශයෙන් පළ කළ යුතුය යන අදහස මුලින්ම ඉදිරිපත් කළේ රාජ්‍ය ඇමති ගරු ආනන්ද තිස්ස ද අල්විස් මහතාය. එතුමා 1980 ඔක්තෝබර් 27 වැනි දින පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධයෙන් කළ ප්‍රකාශය ‘හැන්සාඩ්’ නිල වාර්තාවේ 1826 පිටුවේ වාර්තා කොට ඇත්තේ මෙසේය:

“තුම්පත් රටා යනුවෙන් අපි වැඩ සටහනක් පටන් ගත්තා. මේ රටේ නැති වී ගෙන යන, නැති වෙන්නට යන ඉතාමත්ම පුදුම විදියේ සංස්කෘතීන් ගැන, ගැමි කතා ගැන, ගැමි සින්දු ගැන, ගැමි අදහස් ගැන ඉතා රසවත් වැඩ සටහනක් අපි ඉදිරිපත් කරනවා. ඒවා පොත් වශයෙන් මුද්‍රණය කළ යුතුයි කියා මා ඊයේ නිගමනය කළා. ඒවා තැටිගත කර පාසල්වලට බෙදා දිය යුතුයයි තීරණය කළා.”

‘තුම්පත් රටා’ වැඩ සටහන් සියල්ල එක් පොතක් වශයෙන් පළ කිරීම දුෂ්කරය. එබැවින් ඒ වැඩ සටහන් අතුරින් තෝරා ගනු ලබන කිහිපයක් වරින්වර පොත් වශයෙන් පළ කිරීමට බලාපොරොත්තු වෙමි. එක් පොතක් එක් විෂය ක්ෂේත්‍රයකට අදාළ පරිච්ඡේද අටකට පමණක් සීමා වනු ඇත. මේ සඳහා පළමුවෙන්ම තෝරා ගන්නා ලද්දේ ‘සිංහල වෙහෙර විහාර’ අළලා සැපයෙන පරිච්ඡේද අටකි.

Sumitha Publish

‘තුම්පත් රටා’ ගුවන්විදුලි වැඩ සටහන සවනට ගොදුරු වූවකි. එය ඇසට ගොදුරු වන පරිදි සකස් කර ගන්නා විට යම් යම් වෙනස්කම් කිරීම අනිවාර්ය වේ. එබැවින් මෙහි පළ වන්නේ ‘තුම්පත් රටා’ වැඩ සටහන්වල පිටපත්ම නොව ඒවා අනුසාරයෙන් සකස් කොට ගන්නා ලද පරිච්ඡේද වේ. ‘සිංහල වෙහෙර විහාර’ පිළිබඳ මේ කුඩා පොත, සිංහල ගැමි සංස්කෘතිය දැන හැඳින ගැනීමට උපකාරයක් වේවා.

**ජේ.බී. දිසානායක**

1987 ඇසළ පුර පසළොස්වක් පෝය දා
නුගේගොඩ, පීටර්ස් පෙදෙසේ,
අංක 2 ‘ඒ’ නිවසේදීය.

# 1



# සිංහල ගමයි පන්සලයි

හඳ මෝරා ගෙන එන කලට මුළු ගමම හඳ එළියෙන් නෑවෙන්නට පටන් ගනී. හඳපානේ වැඩියක්ම බබළන්නේ පන්සලේ වෙහෙර වහන්සේයි. පන්සලට එක් රැස් වන බැතිමතුන්ගේ සාදු නාදයට සණ්ටාර නාදයත් එකතු වී හඳ එළියත් සමඟ මුසු වී ගමේ වෙල් යාය පසා ගෙන පැතිර යන විට ගමත් පන්සලත් එකක්ම බවට පත් වේ.

© Sumitha Publish

හැම ගමකම පන්සලක් පිහිටා නැත. එසේ වුවත් හැම සිංහල ගමක්ම කිසියම් පන්සලකට අයත් වේ. ‘ගොදුරු ගම්’ යනුවෙන් හැඳින්වෙන ගම් කිහිපයක් හැම පන්සලකටම අයත් වන බැවිනි. පන්සලට අවශ්‍ය සිව්පසය වැනි දේ මේ ගොදුරු ගම්වලින් ලැබේ. පන්සලට අයිති ‘පිං කුඹුර’ හෝ ‘පිං අරාව’ වැඩ කොට දෙන්නෝ මේ ගම්වල ගොවියෝය.

ගමේ පන්සල වැඩි වශයෙන්ම පිහිටියේ ගමේ අනික් ගෙවල්වලින් කැපී වෙන් වී පෙනෙන තැනකය. ගම තැනිතලා බිමක් නම් පන්සල පිහිටියේ ගම මැදය; බොහෝ විට වෙල් යායක් මැදය. ගම පිහිටියේ කඳුකරයක නම් පන්සල පිහිටියේ කාටත් හොඳින් පෙනෙන කඳු මුදුනකය. ගමට නොයෙකුත් පණිවිඩ යැවෙන්නේ පන්සලෙන් බැවින් මෙවන් තැන්වල පන්සල් පිහිටුවීම වැදගත් වේ.

පුරාණ සිංහල ගම දෙස බලන කල ගමට පන්සලත්, පන්සලට ගමත් නැතිවම බැරි බව පෙනේ. ඒ දෙක අතර පැවතුණේ එතරම් සමීප සම්බන්ධකමක් බැවිනි. පන්සල සිංහල ගැමියාගේ එදිනෙදා ජීවිතයට සම්බන්ධ වන්නේ ඔහු මෙලොව එළිය දකින්නටත් පෙරාතුව සිටය. ගමේ පැවැත්වෙන හැම උත්සවයකටම පන්සල සම්බන්ධ වේ. ගොවිතැන් බත් කිරීමට පවා පන්සලේ හාමුදුරුවන්ගේ උදව් උපකාර අවශ්‍ය වේ.

සිංහල ගැමියාට පන්සලට වඩා ‘ශුද්ධ භූමියක්’ තවත් නැත. ඔහු පන්සල ශුද්ධ භූමියක් වශයෙන් සලකන්නේ බුද්ධ, ධම්ම හා සංඝ යන ත්‍රිවිධ රත්නයටම එය වාසභූමියක් වන බැවිනි. ජීවමානව තුණත් බුදු හාමුදුරුවෝද පන්සලේ වැඩ හිඳිති. උන් වහන්සේගේ සුවාසූ දහසක් ධර්මස්කන්ධය ලියා ඇති පොත් වහන්සේලාද පොත් ගුලේ වැඩ හිඳිති. සංඝයා වහන්සේලා ජීවමානවම ආවාසයෙහි වැඩ හිඳිති.

බුදු හාමුදුරුවන් පන්සලේ වැඩ හිඳිතියි බෞද්ධයන් සලකන්නේ උන් වහන්සේට සම්බන්ධ ධාතූන් වහන්සේලා තුන් නමක් මේ බිමේ වැඩ සිටින බැවිනි. මේ ධාතූන් වහන්සේලා බෞද්ධයන් විසින් හඳුන්වනු ලබන්නේ ‘ශාරීරික ධාතු’, ‘පාරිභෝගික ධාතු’ හා ‘උද්දේසික ධාතු’ යන නම්වලිනි. බෞද්ධයා පන්සලට ගිය කල වන්දනමාන කරන්නේ මේ අනුපිළිවෙළිනි. ‘ධාතූන්’ උදෙසා ‘චෛත්‍ය’ යන නමද යෙදේ.

© Sumitha Publish

ඔහු පළමුවෙන්ම වැඳුම් පිදුම් පවත්වන්නේ බුදුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලා නිදන් කොට ඇති වෙහෙර වහන්සේටය. ‘ස්තූපය’ ‘චෛත්‍යය’ ‘සෑය’ ‘දාගැබ’ යන නම්වලින්ද මේ වෙහෙර වහන්සේ හඳුන්වනු ලැබෙති. “වන්දාමි චේතියං සබ්බං” යන ගාථාව කියා වඳින කල, පන්සලේ වෙහෙර වහන්සේ පමණක් නොව සියලුම දාගැබ් බෞද්ධයාගේ සිතට නැගේ.

ඔහු දෙවනුව වඳින්නේ බුදු හාමුදුරුවන්ගේ පාරිභෝගික ධාතූන් වහන්සේ වශයෙන් සැලකෙන බෝධීන් වහන්සේටය.